**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 02 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු. 61,479 ක් වූ මේස 04 ක් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) මුද්දර බදු ලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර බදු ශේෂය රු. 24,315 ක් වුවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 278,121 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වගකීම් රු. 253,806 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ආයුර්වේද මධ්‍යස්ථාන 04 ක ඉතිරි ඖෂධ තොගය රු. 496,095 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුල එය රු. 830,941 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වත්කම් රු. 334,846 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු. 294,148 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා වැය විෂයයෙහි වියදම රු. 157,383 කින් වැඩියෙන් හා පොලී ගෙවීම් වැය විෂයයෙහි වියදම රු. 159,662 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී රු. 318,188 කට මිලදී ගෙන තිබුණු පුස්තකාල පොත් රු. 307,590 ක් ලෙස ප්‍රාග්ධනගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු. 10,598 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 02 කට අදාල ශේෂ, උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී එකතුව රු. 1,223,418 ක වෙනසක් පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලැබියයුතු ශේෂ වශයෙන් රු. 96,255,541 ක් දක්වා තිබුණද, ඊට අදාල ලෙජර් ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 96,344,694 ක් වූයෙන් රු. 89,153 ක නොසැසඳීමක් විය.

(ඇ) විවිධ වැය විෂයයන් 03 ක් සම්බන්ධයෙන් වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන අතර එකතුව රු. 557,229 ක වෙනසක් විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 62,653 ක් වූ ලැබියයුතු සේවක ණය අයකරගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 34,407,719 ක් වූ ණයහිමියන් 2017 පෙබරවාරි 17 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි.

## 1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103(1) | 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව රු. 45,780 ක් වූ භාණ්ඩ ඌනතාවයන් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | දෙන ලද අත්තිකාරම් කාර්යය නිම කල විගසම පියවිය යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 සිට අවුරුදු 21 දක්වා කාලයක් ගතවී ඇති එකතුව රු. 1,343,504 ක් වූ අත්තිකාරම් 59 ක් පියවා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කල දින සිට මාස 06 සිට වසර 04 ක කාලයක් ගතවී තිබුණු නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල එකතුව රු. 245,421 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 571(2) | 2011 වර්ෂයේ සිට 2014 ජූනි 30 දින දක්වා කාලපරිච්ඡේදයට අදාල වූ රු. 447,504 ක තැන්පතු නියාදනය කිරීමට 2017 පෙබරවාරි 17 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ 5(5) වන අතුරු ව්‍යවස්ථාව | අනවසර ඉදිකිරීම් 02 ක් සම්බන්ධයෙන් ලිඛිත දැනුම් දීම් සිදුකර මාස 01 ත් මාස 12 ත් අතර කාලයක් ගතවී තිබුණද, 2017 පෙබරවාරි 17 දින වනවිටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 12,823,818 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,789,168 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,034,650 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 6,034,650 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 04 ක රු. 4,307,691 ක වර්ධනය හා වියදම් විෂයයන් 05 ක රු. 2,990,332 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 6,688 | 9,039 | 12,858 |
| බදු කුලී | 4,365 | 5,945 | 880 |
| බලපත්‍ර ගාස්තු | 777 | 804 | 7 |
| වෙනත් ආදායම් | 54,279 | 45,652 | 22,174 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදුකුලී හා බලපත්‍ර ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 09, සියයට 48 හා සියයට 06 කින් වැඩි වී තිබූ අතර වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 22, සියයට 23 හා සියයට 32 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම්

2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 12,611,903 ක් වූ අතර, ඒ තුල වර්ෂ 01 සිට වර්ෂ 47 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන රු. 10,000 කට වැඩි හිඟයක් සහිත වරිපනම් ඒකක 92 කින් ලැබිය යුතු රු. 1,892,624 ක ශේෂයක් ඇතුලත් වී තිබුණි.

### 2.3.4 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති IV (ආ) කොටසේ අංක 39 යටතේ දක්වා ඇති 02 වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දැන්වීම් ප්‍රදර්ශනය සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රයක් සභාවට ඉදිරිපත් කර නොතිබිය දී, 2016 වර්ෂය තුල අවස්ථා 43 කදී බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ආ) සබරගමුව පළාත් සභාවේ පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව නිකුත් කර තිබුණු අභ්‍යන්තර විගණන විමසුමකට අනුව 2016 දෙසැම්බර් 09 දින සභාවේ සිට කොළඹ දෙසට දිවුරුම්පිටිය දක්වා ඇති දැන්වීම් පුවරු පිළිබඳ සිදුකරන ලද සමීක්ෂණයේදී මුදල් අය නොකර දැන්වීම් ප්‍රදර්ශනය කල අවස්ථා 57 කින් එකතුව රු. 613,045 ක් අයවීමට තිබුණු බව පෙන්වා දී තිබුණද, එම ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඇ) ඇහැලියගොඩ පිහිටි සභාවට අයත් මස්කඩ දෙකකින් 2013 වර්ෂයට හා 2015 වර්ෂයට අදාලව පිළිවෙලින් රු. 150,209 ක හා රු. 202,200 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි.

(ඈ) ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ලට අදාලව එක්වන් මුදල් (Key Money) අයකිරීම මාසික වාරික වශයෙන් සිදුකර තිබුණු අතර, 2017 ජූනි වනවිට කඩකාමර 05 කින් රු. 59,999 ක්

අඩුවෙන් අයවී තිබුණි. තවද, කඩකාමරයකින් රු. 330,000 ක් වූ සම්පූර්ණ එක්වන් මුදලම අයවිය යුතුව පැවතුණි.

## 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 කින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කාර්යසාධනය

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ලේඛනය අනුව සංවර්ධන කටයුතු වෙනුවෙන් රු. 400,000 ක් වෙන්කර තිබුණද, වෙන් වෙන් වශයෙන් ව්‍යාපෘති හඳුනාගෙන නොතිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුල මධ්‍යම රජය, සබරගමුව පළාත් සභාව සහ ප්‍රාදේශීය සභාවට අදාල ප්‍රතිපාදන යටතේ එකතුව රු. 30,911,978 ක් වූ ව්‍යාපෘති 113 ක් ඉටුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද කර්මාන්ත වල ව්‍යාප්තිය සහා බල ප්‍රදේශයේ පවතින ග්‍රාම නිලධාරී වසම් සමඟ සන්සන්දනය කලවිට එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා කර්මාන්ත 16 ක් ඉටුකර තිබූ අතර, එම වසමට වඩා වැඩි ජනගහනයක් සිටින වසම් 07 ක ඊට වඩා අඩු කර්මාන්ත සංඛ්‍යාවක් ඉටුකර තිබුණි. තවද, ග්‍රාම නිලධාරී වසම් 16 ක කිසිදු කර්මාන්තයක් ඉටුකර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලද ගැටහැත්ත වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ තාවකාලික වෙන්කිරීම් කරන ලද 9'x9' කොටස් 08 ක් සහ උඩු මහලේ වර්ග අඩි 3239 ක් වූ සම්පූර්ණ ප්‍රමාණයම 2017 ජූනි වනවිටත් ආදායම් උත්පාදනය කරන අයුරින් උපයෝජනය කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුමක 2012 ජනවාරි සිට පැවත එන රු. 12,141 ක් වූ හඳුනානොගත් වෙනස 2017 ජූනි වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණු අතර, 2011 ජූනි මසදී මුදල් පොතේ ලැබීම් යටතේ සටහන් කර තිබූ රු. 2,300 ක තැපැල් ඇණවුම් වටිනාකමක් බැංකු ශේෂයට එකතු වී නොතිබුණි.

(ඇ) පළාත් පාලන අමාත්‍යාංශය මගින් 2015 පෙබරවාරි 06 දින සභාවට ලැබී තිබූ මෝටර් ග්‍රේඩරය සඳහා ක්‍රියාකරුවෙකු නොමැති වීම හේතුවෙන් ලැබූ දිනයේ සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යයව පැවතුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ "ඇ" කොටසේ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමේදී පළාත් පාලන ආයතන ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කරන ලද "පළාත් පාලන ආයතන වලට බලතල පවරා දීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාව අනුව සභා බල ප්‍රදේශය තුල පිහිටි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුකර එකී කර්මාන්ත පිළිබඳ නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කල යුතු වුවද, පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට සභාව වෙත පැමිණෙන කර්මාන්ත වලට පමණක් බලපත්‍ර නිකුත් කර තිබූ අතර, 2017 පෙබරවාරි 17 දින වනවිට කර්මාන්ත 14 කින් රු. 61,580 ක් පමණක් පරිසර බලපත්‍ර ආදායම වශයෙන් රැස්කර තිබුණි. තවද, පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු ආයතන 18 ක් කර්මාන්ත හා වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණද, පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයෙහි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී ගාස්තු අයකර නොතිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පොදු ළිඳක් වශයෙන් භාවිතා කිරීම සඳහා රු. 50,387 ක් වැයකර 2016 ජූනි 30 දින අළුත්වැඩියා කර තිබුණු ගනේගොඩ බොන ළිඳේ, පෞද්ගලික නිවාස 02 කට මෝටර් යොදා ජලය ලබා

ගැනීමේ බලාපොරොත්තුවෙන් බට 02 ක් සවිකර තිබූ බව භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය වූයෙන් එම ඉදිකිරීම තුලින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(IX)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහන සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, සභාව විසින් යථෝක්ත කරුණ සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට 2017 පෙබරවාරි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය තුල කසළ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් සභාව සතුව නොතිබූ අතර, මුළු සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ එකතු කිරීමක් සිදු නොකරන බවත්, කසළ එකතු කිරීමේදී දිරන හා නොදිරන කසළ වශයෙන් වර්ගීකරණය කර නොතිබුණි.

(ඇ) සභාව විසින් 2014 වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කර තිබුණද, 2016 වර්ෂයේ මුල සිට එම ව්‍යාපෘතිය අසාර්ථක වී නිෂ්පාදනය නතර වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සේවකයින් තිදෙනෙක් පමණ යොදවා තිබූ නමුත් නිසි සෞඛ්‍ය පහසුකම් හා අනෙකුත් පහසුකම් නොමැති වීම මත ඔවුන් එම කොම්පෝස්ට් පොහොර අංගනයේ සේවයේ නිරත වීම ප්‍රතික්ෂේප කර තිබුණි. 2017 ජූනි දක්වා මෙම ගැටළුවට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ 9.4 වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දරිද්‍රතාවය හේතුකොටගෙන සභාව විසින් නිදහස් කරනු ලැබූ පදිංචිකරුවෙකු නොවන, කසළ ශෝධන සේවාව මඟින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවෙකු විසින් සභාව ඒ සඳහා නියම කරනු ලබන කසළ ශෝධන ගාස්තුවක් සභාව වෙත මාස්පතා ගෙවනු ලැබිය යුතු වුවත්, සභාව විසින් කසළ ශෝධන සේවාව සඳහා ගාස්තු අය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

### 4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

---------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම රු. 5,999,572 ක් වූ විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | අත්හැරීම් දෝශ පැවතීම |
| | | (ii) | වෙන්කිරීම් සිදු නොකිරීම |
| | | (iii) | අඩුවෙන් දැක්වීම |
| | | (iv) | නොසැසඳීම් තිබීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | නියමිත ආදායම හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් අයකර නොගැනීම |
| (ඇ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් පරිදි බැහැර නොකිරීම |
| (ඈ) | වත්කම් පාලනය | | වත්කම් නිෂ්කාර්යව පැවතීම සහ භාවිතයට නුසුදුසු වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම |